**විෂය** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**ශ්‍රේණිය** - 8

**මාසය** - ඔක්තොම්බර් **සතිය** - 03 **ක්‍රියාකාරකම් අංකය** - 39

**සැකසුම**- ඊ.අංජලී සඳරේඛා - ර/ඇඹි/ආදොළුව විද්‍යාලය

## 5 - භෞතික ආගණනය සඳහා මෘදුකාංග භාවිතය

## 5.7 MultiMedia Logic මෘදුකාංගය භාවිතයෙන් OR ද්වාරයේ ක්‍රියාකාරීත්වය විමසා බලමු

**ශිෂ්‍ය කාර්යය -**

- පාඩම හොඳින් අධ්‍යයනය කරන්න. (වැඩ පොතේ පිටු අංක 40 - 41)
- අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු විමසා අවබෝධ කරගන්න.
- මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- මෙම කාර්ය පත්‍රිකාවේ සඳහන් ක්‍රියාකාරකම් සහ මෙම පාඩමට අදාළව ඔබේ කියවීම් පොතේ හා වැඩපොතේ සඳහන් ක්‍රියාකාරකම් සිදුකරන්න.
- ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩමට අදාළව උපකාර කරගත හැකි ඉගෙනුම් ආධාරක -**

- ගුරු ගෙදර - https://www.youtube.com/watch?v=f72i8fcnG5M
- වෙනත්
  - Youtube - https://www.youtube.com/watch?v=3blG7nyxL5M

    https://www.youtube.com/watch?v=-nPfvNEXASs

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල -**

- තාර්කික ද්වාරවල ක්‍රියාකාරීත්වය මෘදුකාංග මගින් හඳුනාගත හැකි බව ප්‍රත්‍යක්ෂ කරගනියි.
- තාර්කික ද්වාරවල ක්‍රියාකාරීත්වය නිරූපණය සඳහා යොදාගත හැකි සරල මෘදුකාංග හඳුනාගනියි.
- තාර්කික ද්වාරවල ක්‍රියාකාරීත්වය නිරූපණය සඳහා යොදාගත හැකි සරල මෘදුකාංග මගින් නිවැරදිව පරිපථ නිර්මාණය කරයි.

**ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය -**

- MultiMedia Logic මෘදුකාංගය භාවිතයෙන් OR ද්වාරයට අදාළ පරිපථ අත්හදා බලමින් ලැබෙන ප්‍රතිදානයන් නිරීක්ෂණය කරන්න. (වැඩපොතේ පිටු අංක 40 - 41)